# හසීගේ පූසි



හසරැලි අබේසිංහ

# හසීගේ පූසි

# 2023

## කතා ප්‍රකාශනයකි

ISBN : 978-624-206-915-9

කථාව හා චිත්‍ර - හසරැලි අබේසිංහ
පාසල - මහාමායා බාලිකා විදුහල - මහනුවර

**2023/12/10**

# පිදුම

කතන්දර පොතක් ලිවීමට මාව

නිරතුරු දිරිගැන්වූ

චාමිනි පල්ලියගුරු මැණියන්ටත්

ආදරණීය දෙමාව්පියන්ටත්

සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

''චූටි නංගි සෙල්ලම් කරමුද?'' මම ඉස්කොලේ ඇරිලා ආපු ගමන් ඔය කතාව නම් හැමදාම අහන්න පුලුවන්.


ආ...  ඔයාලට කියන්න බැරි වුණානේ. මේ මම තමයි හසී



අර මට සෙල්ලම් කරන්න කතා කරන්නේ,
ඒ තමයි අල්ලපු ගෙදර චූටි මල්ලි.

ඇත්තටම එයා මට කතා කරන්නේ චූටි නංගි කියලා. ඒත් මම ඉන්නේ දෙක වසරේ. එයා නම් තාම පෙර පාසල් යන්නේ. චූටි මල්ලිට මම හසී අක්කා කියන්න කිව්වත් එයා මට කියන්නේ චූටි නංගි කියලනේ.






චූටි මල්ලිට ඉන්නේ අයියලා දෙන්නෙක්. ගෙදර නිතරම ඇතිවෙන රණ්ඩු බේරන්න බැරි නිසාමද කොහෙද චූටි මල්ලි අපේ ගෙදර හිටියට එයාගේ අම්මා කවදාවත්ම බනින්නේ නැහැ.

මොනවා වුණත් චූටි මල්ලිත් මමත් නිතරම සෙල්ලම් කළාට කවුරුත් මොකුත් කිව්වේ නෑ.

චූටි මල්ලි නම් ගොඩක් ආස අල්ලං සෙල්ලං කරන්න. ඉතිං මම ගොඩක් වෙලාවට එයත් එක්ක හති වැටෙනකං දුවනවා. තව අපි හැංගි මුත්තං කලා. වැලි බත් ඉව්වා. බයිසිකල් පැද්දා. වෙලාවකට අපි රණ්ඩුත් වුණා.

මට ඉස්කොලේ නිවාඩු තිබුන දවසක චූටි මල්ලි මමයි උදේම දුව දුව හිටියා. ඒ වෙලාවේ `` ඤැව් ඤැව් '' කියමින් කෙදිරි ගාන හඬක් මට ඇහුණා.`` චූටි මල්ලි ඔයාට ඒ සද්දය ඇහුණද?`` මං සද්දය ඇහෙන පැත්තට ගියා. ගොඩක් අමාරුවෙන් කෑගසමින් හිටියේ පූස් පැටියෙක්. එයාට ඇවිදින්නවත් පණක් තිබුනේ නෑ. මම පූස් පැටියා වඩාගෙන ගෙදර ගෙනාවා.





අම්මටයි තාත්තටයි මෙහෙ එන්නකො කියලා මම කෑගැසුවා.
අම්මයි තාත්තයි දුවගෙන මං ඉන්න තැනට ආවා.
'' තාත්තේ අපි මෙයාට බෙහෙත් දාමු''
කියලා පූසාව මං තාත්තට දුන්නා.බෙහෙත් දාන්න කලින්
''අපි මෙයාට කන්න මෙනවා හරි දෙමු''
කියලා අම්මා ඌට කිරි හදලා දුන්නා.
ඌ කිරි ටික ඉක්මණින් බිව්වා.

තාත්තා පූස් පැටියාව දොස්තර මාමා ලගට
එක්කන් ගියා. බෙහෙත් දාගෙන ආවා.

පූස් පැටියාගේ තැන තැන බූල් කපලා තුවාල
වලට බෙහෙත් දාල තිබුණා.

අම්මා උෟව පෙට්ටියකින් තිබ්බා.

මමයි චූටි මල්ලියි පෙට්ටියට එබිකම් කරමින් පූසා දිහා බැලුවා.
උෟත් අමාරුවෙන් ඔළුව උස්සලා බලලා ආයෙත් නිදා ගත්තා.

ටික දවසක් යන විට පූස් පැටියාට හොඳවෙමින් තිබුණා. දැන් උෟ අපිත් එක්ක සෙල්ලම් කරන්නත් එනවා.



එක දවසක් අම්මා තාත්තා අතින් කිවුවා
''පූසාව හදාගන්න කැමති කෙනෙක් ඉන්නවා නම් දීල දාමු''

''හා මං බලන්නම්'' තාත්තා කිවුවා.



මට ගොඩාක් දුක හිතුණා. පුස් පැටියා කාටහරි දෙන්න ඕන කියලා අම්මා කිව්වා. මං ඒ ගැන චූටි මල්ලිට කිව්වා. '' අනේ චූටි මල්ලී මට පූස් පැටියව තියාගන්න ඕනී. ඔයා මට එකට උදව් කරනවාද? ''මොනවද කරන්නේ කියලා අපි ගොඩාක් කල්පනා කලා. එක පාරම චූටි මල්ලි මගෙන් ඇහුවා '' ඔයාගේ උපන් දිනය කවද්ද? '' කියලා. '' ආ... මගේ උපන් දිනය ඒක මොනවාටද? '' මං ඇහුවා. '' ඔයාගෙ උපන් දිනයට පූස් පැටියාව තියාගන්න ඉල්ලන්න.'' ''මගේ උපන් දිනය නොවැම්බර් විසි දෙක කියලා මට මතකයි. ඒත් ඒකට තව කොච්චර කල් තියෙනවද කියලා මම දන්නේ නෑ.'' මං ඒ ගැන අක්කගෙන් අහුවා. '' අද නොවැම්බර් දාහතනේ තව දවස් පහක් තියෙනවා'' අක්කා මට කිවුවා.



මගේ උපන් දිනය දවසේ චූටි මල්ලි උදේම අපේ ගෙදර ආවා. එයා මට රහසින් කිවුවා '' අරක අහන්න අහන්න'' කියලා. මං අම්මයි තාත්තයි ඉන්න තැනට හිමීට ගියා. චූටි මල්ලීත් මාත් එක්ක ආවා. අම්මයි තාත්තයි මට සුභ පැතුවා. '' ආ.. චූටි මල්ලීත් ඇවිත් ඉන්නේ '' අම්මා කිව්වා. මම බලන් ඉන්නවා දැකලා චූටි මල්ලි අපේ අම්මගෙන් අහුවා චූටි නංගිට තෑග්ගක් දෙනවද'' කියලා. '' ඒ මොකද්ද අනේ එයා ඉල්ලන තෑග්ග'' කියලා අම්මා ඇහුවා. ' නැන්දේ මෙයාට පූස් පැටියාව තියා ගන්න දෙනවද? '' කියලා චූටි මල්ලි අම්මට කිව්වා. '' ඔව් අම්මේ මට එයාව ඕනී '' කියලා මං කිව්වා. අම්මයි තාත්තයි ඒකට කැමති වුණා.



චූටි මල්ලීයි මායි පූස් පැටියව අරං එළියට දිවුවා. මට හරිම සතුටුයි. '' හසීගේ පූසී.... හසීගේ පූසී.... '' කියමින් චූටි මල්ලි කෑගැසුවා.

නිමි.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

ISBN : 978-624-206-892-3

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ